# මළවුන් සිහිපත් කිරීම

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 25:6–9

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"ස්වාමින් වහන්සේ මරණය සදහටම විනාශ කර දමන සේක."

සියලු බලැති සමිඳාණන් වහන්සේ මේ සියොන් කන්ද මත සියලු ජාතීන් හට ඉස්තරම් මුද්‍රික පානයෙන් හා රසමසවුලින් යුත් මංගල භෝජනයක් සූදානම් කරන සේක. මෙහි දී උන් වහන්සේ සියලු ජාතීන් වසාගෙන පැවැති දුක නමැති වලාකුළ පහකරන සේක. මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මරණය සදහට ම විනාශ කරදමන සේක. සියලු මුහුණුවලින් කඳුළු පිසදමන සේක. ලොව මුළුල්ලේ තමන්ගේ සෙනගට ඇති වී තිබෙන නින්දාව පහකරන සේක. මෙසේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ ම ය.

එසේ සිදු වූ විට සියලු දෙනා මෙසේ කියනු ඇත. "බලන්න, මේ අපේ දෙවියන් වහන්සේ ය: උන් වහන්සේ අප ගළවා ගන්න සේකැ යි බලාපොරොත්තුවෙන් සිටියෙමු. උන් වහන්සේ අපේ සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ අප ගළවාගත් බැවින් අපි ප්‍රීති සන්තෝෂ වන්නෙමු."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 23:1–6

පිළිතුර: සමිඳුණෝ මා එඬේරාණෝය. අග හිඟ මට නොවන්නේය.

ගීය : සමිඳාණෝ මා එඬේරාණෝ ය:
අග හිඟ මට නොවන්නේ ය.
එතුමාණෝ තිල් තණ බිම් මත මා සතප්වා,
නිසල දිය වෙත පමුණුවා, මා පණගන්වන සේක.
සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දමිටු මඟ මා ගෙන යන සේක.

මරණය වැනි ගත'දුරු රුදුරු නිම්නය මැදින් ගියත්,
ඔබ මා සමඟ බැවින්, මට කිසි බියක් නොවන්නේ ය.
ඔබේ කෙවිට ද සැරයටිය ද මා නියත සැනසිල්ල වන්නේ ය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී, මංගල බොජුනක් පිළියෙළ කර දී,
මා සිරස තෙලින් ආලේප කරන සේක.
මාගේ කුසලාන උතුරා යන්නේ ය.
ඔබේ දයාව හා කරුණාව නියත ව,
දිවිහිමියෙන් මා අනුව එන්නේ ය.
සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 5:5–11

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"දැහැමියෙකු උදෙසා දිවි පිදීමක් සිදු වන්නේ කලාතුරකිනි."

අපට හිමි වන්නට යන දේව මහිමයේ බලාපොරොත්තුවකින් කිසි ම කලකිරීමක් ඇති නොවෙයි. මන්ද, අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක.

අප අනාථ ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ පව්කාරයන් උදෙසා නියමිත කාලයේ දී සිය දිවි පිදූ සේක. සත් ගුණවත් කෙනෙකු උදෙසා දිවි පිදීමට යමෙකු තුළ ධෛර්යය තිබුනත් එවැන්නෙකු උදෙසා දිවි පිදීමක් සිදුවන්නේ කලාතුරකිනි. අප උදෙසා ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ වන්නේ අප පව්කාරයන් ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි. ක්‍රිස්තුන් වහන්සේගේ යාගික රුධිරය හේතුවෙන් දමිටු බවට පමුණුවනු ලැබ, උන් වහන්සේ කරණකොටගෙන දේව උදහසින් මිදීම ගැන අපට වඩාත් සහතික ය. අපි සතුරන් ව සිටිය දී ම දේව පුත්‍රයාණන්ගේ මරණය නිසා උන් වහන්සේ සමඟ සමගි කරනු ලැබුවෙමු නම්, එසේ සමගි කරනු ලැබූ අපි, දැන් ඊටත් වඩා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය නිසා ගැළවීම ලබමු. එපමණකුත් නොව, දෙවියන් වහන්සේ හා සමඟ නැවත අපට සමගිය අත් කර දුන් ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් අපි දෙවියන් වහන්සේ කෙරේ අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමු.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
“ස්වාමින් වහන්සේ තුළ නසින්නෝ භාග්‍යවන්තයෝ ය.
ඔව්හු තමන්ගේ වෙහෙසීම් වලින් නිවාඩු ලබති.
ඔවුන්ගේ ක්‍රියා ඔවුන් කැටුව එන්නේ ය”යි
ආත්මයාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 6:37–40

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "මම ද අන්තිම දවසේ දී ඔවුන් උත්ථාන කරන්නෙමි."

"පියාණන් වහන්සේ මට දෙන සියල්ලෝ ම මා වෙතට පැමිණෙති: මා වෙතට පැමිණෙන්නා මම කිසි සේත් ඉවත නොදමමි. මා ස්වර්ගයෙන් පහළ වූයේ මාගේ ම කැමැත්ත කරන පිණිස නොව, මා එවා වදාළ තැනැන් වහන්සේගේ කැමැත්ත කරන පිණිස ය. මා එවා වදාළ උන් වහන්සේගේ කැමැත්ත නම්, උන් වහන්සේ මට දුන් සියල්ලන්ගෙන් එක් කෙනෙකු වත් නැති වන්නට නැර, සියල්ලන් ම අන්තිම දවසේ දී මා විසින් උත්ථාන කරනු ලැබීම ය. පුත්‍රයාණන් වහන්සේ දැක උන් වහන්සේ අදහාගන්නා හැම කෙනෙකු ම සදාතන ජීවනය ලැබීම මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ය. මම ද අන්තිම දවසේ දී ඔවුන් උත්ථාන කරන්නෙමි"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*